දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA
තැ.පෙ.43/தபால் பெட்டி 43 /P.O.Box 43
පරණ ගලහ පාර, පේරාදෙණිය, ශ්‍රී ලංකාව
பழைய கலகா வீதி, பேராதனை, இலங்கை
Old Galaha Road, Peradeniya, Sri Lanka

මගේ අංකය: / எமது இலக்கம்: / My Ref:

ඔබේ අංකය: / உமது இலக்கம்: / Your Ref:

2024-02-05

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් වෙත,

**උපාධි ප්‍රදානෝත්සවය (බාහිර) - 2023**

ප්‍රිය උපාධි අපේක්ෂකයිනි,

**01** 2021 දෙසැම්බර් මස සහ 2022 ජනවාරි මස පැරණි නිර්දේශය යටතේ පවත්වන ලද කලා අවසන් උපාධි පරීක්ෂණයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සමත් උපාධි අපේක්ෂකයන්, 2022/2023 වසරවල නව නිර්දේශය යටතේ අවසන් උපාධි පරීක්ෂණයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සමත් උපාධි අපේක්ෂකයන් සහ 2020/2021 වසරවල පවත්වන ලද ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පරීක්ෂණයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සමත් වූ උපාධි අපේක්ෂකයන් සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය **2024 අප්‍රේල් මස 25** වන දින **පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරයේදී** පැවැත්වීමට නියමිතය.

**02** මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලැබීමට සුදුසුකම්ලත් උපාධි අපේක්ෂකයන් මේ සමඟ CDCE වෙබ් අඩවියේ උඩුගත (upload) කර ඇති අයදුම් පත්‍රය බාගත (download) කර එහි සඳහන් තොරතුරු සම්පූර්ණ කර **( අයදුම් පතශ්‍ය සම්පූර්ණ කිරීමේදී ඔබගේ ක්‍රියාකාරී දුරකථන අංක සහ විද්‍යුත් ලිපිනය (email) සඳහන් කර එවීම අනිවාර්යය වේ) 2024-02-28** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"උපාධි ප්‍රදානෝත්සවය (බාහිර) - 2023"** යනුවෙන් සඳහන් කර **"සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, තො. 43, පරණ ගලහ පාර, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (බාගත කරන ලද අයදුම් පත මුද්‍රණය කිරීමේදී A4 කොළයක දෙපැත්තෙහි මුද්‍රණය කිරීමට කාරුණික වන්න). **තවද මෙයට සමගාමීව මේ සමග CDCE වෙබ් අඩවියේ උඩුගත (upload) කර ඇති google පෝරමය පිරවීමද අනිවාර්ය වේ.**

**Link:** https://forms.gle/xNYPygsvHn7mzi1y6

**03** සහතික පත්‍ර ගාස්තු සහ උපාධි ප්‍රදානයට අදාල සියලුම වියදම් ආවරණය කර ගැනීම සඳහා **රු. 10,000/-** ක් වන ගාස්තුව **උපාධි උත්සවයට සහභාගි වන සහ සහභාගි නොවන සියලුම උපාධිධාරීන්** විසින් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් **පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අංක 057-1-001-4-1338036** දරන ගිණුමට බැර කර මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියේ **(Orginal Cash Deposit Slip)** මුල් පිටපත සමඟ ඔබ විසින් සම්පූර්ණ කර මුද්‍රණය කරන ලද අයදුම් පත්‍රය අප වෙත එවීම **අනිවාර්ය වේ.**

- ❖ මින් ඉදිරියට උපාධි ප්‍රදානෝත්සවයට අදාල විස්තර අපගේ **CDCE** වෙබ් අඩවියේ **https://cdce.pdn.ac.lk/** පළකරනු ලබන අතර ඔබ විසින් අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති දුරකථන අංක, email ලිපිනය ඔස්සේ උපාධි ප්‍රදානෝත්සවයට අදාල පණිවුඩ දැනුම්දෙනු ලැබේ. එබැවින් එම අංක සහ email ලිපිනය නොවෙනස්ව පවත්වා ගෙන යන ලෙස දන්වා සිටිමි.

ජේ.පී. වෙස්ලි
සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය